# <u>ගිණුම්කරණය - 8 - ලාභ අරමුණු කර නොගත් සංවිධාන</u>

1.පහත දැක්වෙන වගුව උපයෝගී කරගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.කාලච්ඡේදය 2019/12/31 න් අවසන් වේ.

| 2018 වර්ෂය තුළ එකතු වූ සාමාජික මුදල් | | | හිඟ හිටි සාමාජික මුදල් | |
|---|---|---|---|---|
| 2017 ට අදාළ | 2018 ට අදාළ | 2019ට අදාළ | 2017 ට අදාළ | 2018 ට අදාළ |
| රු.1,000 | රු.15,000 | රු.1,000 | රු.4,000 | රු.8,000 |

2017 වර්ෂය තුළදී ලද 2018 වර්ෂයට අදාළ සාමාජික මුදල් රු.1,000ක් නම්,

1.ආදායම හඳුනාගැනීමේදී මුදල් පදනම යොදා ගනී නම් 2018 වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ වාර්තා කළ යුතු සාමාජික මුදල වන්නේ,

1. රු.16,000
2.රු.18,000
3.රු.17,000
4.රු.19,000
5.රු.20,000

2.ඉහත ක්‍රීඩා සමාජයේ 2018/12/31 දිනට හිඟ හිටි හා කලින් ලද සාමාජික මුදල පිළිවෙලින් දැක්වෙනුයේ,

1.රු.8,000 හා රු.3,000කි.
2.රු.8,000 හා රු.2,000කි.
3.රු.8,000 හා රු.1,000කි.
4.රු.9,000 හා රු.1,000කි.
5.රු.10,000 හා රු.1,000කි.

3.ABC ක්‍රීඩා සමාජයේ 2020/09/30න් අවසන් වර්ෂයට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | 2020/09/30 | 2019/09/30 |
|---|---|---|
| හිඟ සාමාජික මුදල | රු.8,000 | රු.3,000 |
| කලින් ලද සාමාජික මුදල | රු.15,000 | රු.11,000 |

කාලච්ඡේදයේදී සාමාජික මුදල් ලෙස රු.70,000ක් ලැබුණේ නම් ආදායම් ප්‍රකාශනයට ගත යුතු සාමාජික මුදල වන්නේ,

1.රු.68,000
2.රු.69,000
3.රු.71,000

4.රු.70,000
5.රු.72,000

4.2018/04/01 දින අරඹන ලද දිලෙන තරු ක්‍රීඩා සමාජයේ 2019/03/31 දිනට එහි සාමාජික සංඛ්‍යාව 120කි.මාසික සාමාජික මුදල එක් අයෙකුගෙන් රු.50කි.2019/01/01 දින සාමාජිකයින් 20ක් අලුතින් බැඳුණු අතර පරණ සාමාජිකයින් 10 දෙනෙකු වර්ෂය සඳහාම මුදල් ගෙවා නැත.අනෙක් සාමාජිකයින්ගෙන් නියමිත පරිදි මුදල් ලැබී ඇත.2019/03/31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනයේ හා ලැබීම් හා ගෙවීම් ගිණුමේ දැක්විය යුතු වටිනාකම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

1.රු.63,000 හා රු.57,000
2.රු.72,000 හා රු.57,000
3.රු.72,000 හා රු.66,000
4.රු.6,000 හා රු.5,500
5.රු.75,000 හා රු.69,000

5.සමගි යෞවන සමාජයේ 2019/06/30න් අවසන් වර්ෂයේ පහත තොරතුරු ඔබට දී ඇත.සමිතියේ යාවජීව සාමාජික මුදලින් 1/10ක් වාර්ෂික ආදායම වන අතර 2018/07/01 යාවජීව සාමාජික මුදල් ගිණුම රු.180,000ක් විය.

| | හිඟහිටි සාමාජික මුදල් | කලින් ලද සාමාජික මුදල් |
|---|---|---|
| 2019/06/30 දිනට | රු.14,000 | රු.19,000 |
| 2018/07/01 දිනට | රු.11,000 | රු.11,400 |

2019/06/30 දිනෙන් අවසන් වර්ෂයට මුදලින් ලද සාමාජික මුදල් රු.50,000ක් නම් හා එහි යාවජීව සාමාජික මුදල් අගයෙන් 1/10ක් වාර්ෂිකව ඇතුළත් නම් ආදායම් ප්‍රකාශයට යා යුතු සාමාජික මුදල් අගය වන්නේ,

1.රු.35,000
2.රු.44,400
3.රු.43,400
4.රු.45,400
5.රු.45,000

6.)2018.04.01 දින අරඹන ලද සිහින යෞවන සමාජයේ 2019.03.31 දිනට සිටි සාමාජික සංඛ්‍යාව 120කි.මාසිකව අය කරන සාමාජික ගාස්තුව රු.100ක් වන අතර 2019.01.01 දින සාමාජිකයින් 10 දෙනෙකු සාමාජිකත්වය ලබා ඇත.2020.03.31 දිනට සාමාජිකයින් 110 දෙනෙකු නියමිත පරිදි මුදල් ගෙවා ඇති නමුත් අනෙකුත් සාමාජිකයින් නියමිත පරිදි මුදල් ගෙවා නැත.මුදල් නොගෙවීම නිසා සාමාජිකයින් 5 දෙනෙකුගේ සාමාජිකත්වය අහෝසි කරන ලදී.2020.03.31න් අවසන් වර්ෂය තුළදී ආදායම් ප්‍රකාශනයේ හා ලැබීම් හා ගෙවීම් ගිණුමේ දැක්විය යුතු අගයන් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

1.රු.144,000 හා රු.132,000
2.රු.12,000 හා රු.11,000
3.රු.138,000 හා රු.126,000
4.රු.132,000 හා රු.144,000
5.රු.120,000 හා රු.126,000

7.සමගි ක්‍රීඩා සමාජයේ 2018.12.31න් අවසන් වර්ෂයට පහත තොරතුරු ඔබට දී ඇත.

| කාලච්ඡේදය | 2018.12.31 දිනට | 2018.01.01 දිනට |
|---|---|---|
| හිඟ සාමාජික මුදල් රු. | 40,000 | 10,000 |
| කලින් ලද සාමාජික මුදල් රු. | 25,000 | 30,000 |

කාලච්ඡේදයට අදාළ සාමාජික මුදල රු.67,000කි.යාවජීව සාමාජිකයින් 30 දෙනෙක් සිටින අතර එක් අයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු.1,000කි.එම සාමාජික මුදල් 2018.12.31 දිනට හිඟ සාමාජික මුදල් ගණනය කිරීමේදී වැරදීමකින් ඇතුළත් කර ඇති අතර එම සාමාජික මුදල් වාර්ෂික සාමාජික මුදල් තුළට ඇතුළත් කර ඇත.
ඉහත තොරතුරු අනුව මුදලින් ලද නිවැරදි සාමාජික මුදල වනුයේ,

1.රු.72,000
2.රු.52,000
3.රු.62,000
4.රු.67,000
5.රු.42,000

8.ක්‍රීඩා සමාජයක සාමාජික මුදල් ගෙවීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | 2020/01/01 දිනට | 2020/12/31 දිනට |
|---|---|---|
| හිඟ සාමාජික මුදල් | 35,000 | 50,000 |
| කලින් ලද සාමාජික මුදල් | 50,000 | 20,000 |

කාලච්ඡේදය තුළ සාමාජික මුදල් ලෙස රු.100,000ක මුදලක් ලද අතර 2020/01/01 දිනට හිඟ සාමාජික මුදලින් රු.14,000ක සාමාජික මුදලක් නිශ්චිතවම අය කර ගත නොහැකි බව තහවුරු වීම නිසා එය කපා හැරීමට තීරණය කර ඇත.මේ අනුව ක්‍රීඩා සමාජයේ 2020/12/31න් අවසන් වර්ෂයේ වාර්ෂික සාමාජික මුදල වන්නේ,

1.රු.159,000
2.රු.140,000
3.රු.160,000
4.රු.150,000
5.රු.136,000

9.දිලෙන තරු ක්‍රීඩා සමාජයේ 2018.09.30න් අවසන් වර්ෂයට පහත විස්තර ඔබට සපයා ඇත.(රු.000)

| අයිතමය / කාලච්ඡේදය | ක්‍රීඩා උපකරණ | හිඟ හිටි සාමාජික මුදල් | ඉදිරියට ලද සාමාජික මුදල් | යාවජීව සාමාජික මුදල් | ගෘහ භාණ්ඩ හා සවිකිරීම් |
|---|---|---|---|---|---|
| 2018/09/30 | 400 | 300 | 40 | 900 | 600 |
| 2017/09/30 | 250 | 400 | 50 | 600 | 400 |

කාලච්ඡේදය තුළ මුදලින් ලද මුළු සාමාජික මුදල රු.1,500,000ක් වන අතර එහි යාවජීව සාමාජික මුදල් (වාර්ෂික) රු.300,000ක් ඇතුළත්ය.කාලච්ඡේදයේ යාවජීව සාමාජිකයින් ලෙස අලුතින් බඳවා ගත් අයගෙන් ලද මුදල හා වාර්ෂික සාමාජික මුදල නිවැරදිව දැක්වෙන්නේ,

1.රු.1,300 හා රු.1,700
2.රු.700 හා රු.1,600
3.රු.900 හා රු.1,500
4.රු.300 හා රු.1,400
5.රු.600 හා රු.1,410

10.XY යෞවන සමාජයේ සාමාජික මුදල් පිළිබඳ පහත තොරතුරු ඔබට ඉදිරිපත් කර ඇත.

| | | |
|---|---|---|
| වර්ෂයේ මුදලින් ලද සාමාජික මුදල | | රු.60,000 |
| ලැබිය යුතු සාමාජික මුදල | 2017.04.01 | රු.8,000 |
| | 2018.03.31 | ? |
| කලින් ලද සාමාජික මුදල | 2017.04.01 | රු.12,000 |
| | 2018.03.31 | රු.8,000 |

මෙම යෞවන සමාජයේ සාමාජිකයින් 120ක් සිටින අතර එක් අයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු.800කි.ඒ අනුව,
2018.03.31 දිනට ලැබිය යුතු සාමාජික මුදල වන්නේ,

1.රු.40,000
2.රු.32,000
3.රු.96,000
4.රු.8,000
5.රු.60,000

## <u>පිළිතුරු</u>

1. 3
2. 3
3. 3
4. 1

5. 4
6. 1
7. 3
8. 1
9. 5
10. 1

**<u>සකස් කළේ -</u>**

**පී.ජී.ඒ.ටී.ඉලංගකෝන් මිය,**
**ර/ශාන්ත ලූක්ස් විද්‍යාලය.**